# තර්ජනය ගෙනෙන පුද්ගල නාශක බිම් බෝම්බ

පුද්ගල නාශක බෝම්බ යන්න අද බෙහෙවින් ප්‍රචලිත වූවකි. ඩොලර් කීපයකින් අල්ලක් පමණ ප්‍රමාණය ඇති, කිලෝග්‍රෑමයක් පමණ බර මෙම පුද්ගල නාශක බෝම්බය අද ලොව පුරා කවුරුත් දන්නා කරුණකි. එමෙන් ම නොයෙකුත් රටවල් ඉමහත් තර්ජනයට මුහුණ පාන්නකි.

මෙහි බිහිසුණුකම රඳා පවතින්නේ යුද්ධයක් අවසන් වී ගිය ද ඒවා සොයා ඉවත් නොකිරීම මත ඉදිරියට ද විනාශයට තුඩු දෙන බව ය. ඒවා අසින් නොකළහොත් යුද කෙළවර වුවත් පා තැබූවකු අනිවාර්යයෙන් විනාශ වන්නේ ය. එවිට හමුදා භටයින් නොව සාමාන්‍ය පුද්ගලයින්ද මෙයට ගොදුරු වන බව කිව යුතු වේ.

රෝම අධිරාජ්‍ය සමයේ සතුරාගේ ඉදිරි ගමන වළකාලීමට මෙවන් ක්‍රම උපයෝගී විය. පළමු ලෝක යුද්ද සමයේ ජර්මන් හමුදා විසින් මෙම උපක්‍රම යොදා ඇති අතර මිත්‍ර හමුදා ගමන් කළ වාහන විනාශ කැරිණි. දෙවන ලෝක යුද සමයේදී යුද්ධ ටැංකි විනාශ කරලීමට උපයෝගී විය. මෙම ආයුධය සතුරා අඩපණ කිරීමට සමත් අතර ලාබදායී වූවකි. නොයෙකුත් ත්‍රස්තවාදී කණ්ඩායම් අතර මෙන් ම යුද හමුදාවන් ද පුද්ගල නාශක බෝම්බ කෙරේ දැඩිව එල්බ ගෙන ඇත. සතුරන් අඩපණ වීම පමණක් නොව වටිනා බිම් ප්‍රදේශ මුලුමනින් ම අසාරවත් කරමින් ආර්ථිකයට ද බලවත් හානි ගෙන දෙන්නේ ය.

පුද්ගල නාශක බෝම්බයෙන් මිය යන සංඛ්‍යාව විශාල ය. ඇෆ්ගනිස්ථා-නය හැර ලොව පුරා 4,50000 ක් පමණ අබ්බගාතයින් පුද්ගල නාශක බෝම්බ නිසා බිහි වී ඇතැයි වාර්තා වේ. එමෙන් දෙගුණයක් පමණ ම පුද්ගල නාශක බෝම්බ නිසා මිය ගොස් ඇත. ඇංගෝලාවේ හමුදා භටයින් 38,000 ක් පමණ අංගවිකල අබ්බගාත තත්ත්වයට පත් ව සිටිති. කාම්-බෝජයේ 30,000 ක් පමණ මෙලෙස වන අතර ඇෆ්ගනිස්ථානයේ සංඛ්‍යාව අති විශාල ය. විවිධ වූ පුද්ගල නාශක බෝම්බ ඇත්තේ ය. එබඳු නිෂ්පාදන රටවල් අතර එක්සත් ජනපදය, ඉතාලිය, රුසියාව, ස්වීඩනය, වියට්නාමය, ජර්මනිය, ඔස්ට්‍රියාව ආදී නොයෙකුත් රටවල් රැසකි.

ලෝකයේ පුද්ගල නාශක බෝම්බ ඉවත් කිරීමට ඩොලර් කෝටි 8500 කට අධික මුදලක් වැය වෙතැයි වාර්තා වේ. දෙවනුව මේ කාර්යය සඳහා සැහෙන කාලයක් වැයවේ. ඒ අතර පුද්ගල නාශක බෝම්බ ඉවත් කිරීමට ද පහසු නොවේ. ඉවත් කරන්නට යාමේදී සිදුවන ජීවිත හානි සහ අබ්බා-ගාතයින් බවට පත්වන සංඛ්‍යාව විශාල ය. පුද්ගල නාශක බෝම්බ එකි-නෙක සොයා ඉවත් කළ යුතු ව ඇත. මේ කාර්යය අතිශයින් භයානක වූවකි. ලොව පුරා ඉවත් කර නොමැති පුද්ගල නාශක බෝම්බ සංඛ්‍යාව අති විශාල ය. සාමාන්‍යයෙන් යුරෝපයේ දශ ලක්ෂ 3-7 , අප්‍රිකාව දශ ලක්ෂ 30, මැද පෙරදිග දශ ලක්ෂ 17-24, දකුණු ආසියාව දශ ලක්ෂ 18-25, නැගෙනහිර ආසියාව දශ ලක්ෂ 18-23 ක් ආදී ලෙස ඉවත් කර නොමැති බෝම්බ සංඛ්‍යාව දක්වෙයි. ඇත්තෙන්ම ලොව පුරා වළලා දමා ඉවත් කර නොමැති පුද්ගල නාශක බිම් බෝම්බ සංඛ්‍යාව මීට වඩා විශාල ප්‍රමාණයක් බව පිළිගැනීමට සිදු වේ.

ශ්‍රී ලංකා ජනතාව අතර ද පුද්ගල නාශක බෝම්බ පිළිබඳව දැන් සැල-කිය යුතු හැඟීමක් ඇත. සාමකාමී වාතාවරණයක පසු වූ ශ්‍රී ලාංකික ජන-තාවට ද්‍රවිඩ ත්‍රස්තවාදී සටන් ව්‍යාපාරය නිසා මෙම පුද්ගල නාශක බෝම්බ ගැන අවබෝධය ලැබිණි.

කුඩා වුවත් අති බිහිසුණු ප්‍රතිඵල උදා කරන මේ අවිය මුළු ලොවට මහත් ම තර්ජනයකි. මේ නිසා මෙම අවිය නිෂ්පාදනය නතර කරලීම පිළිබඳව ද ලෝක නායකයින්ගේ සැලකිල්ල යොමු වෙමින් පවතී. ❑

**සිරිපාල මාදුවගේ**